**ශීර්ෂය 1 – අතිගරු ජනාධිපති කාර්යාලය**

-------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මතය**

-------

අතිගරු ජනාධිපති කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 දෙසැම්බර් 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලින් 2020 දෙසැම්බර් 31 දිනට අතිගරු ජනාධිපති කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කාර්යාලීය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහ සංවර්ධන සහායන් යන මූලධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු රු.5,015,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි කාර්යයන් ක්‍රියාත්මක කළ නොහැකි වීම නිසාත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වැය විෂයෙහිද, කාර්යසාධන බලකා කාර්යාලය අග්‍රාමාත්‍ය කාර්යලයේ ස්ථාපිත කරන ලද බැවින් ප්‍රාග්ධන උපකරණ අවශ්‍යතා එම කාර්යාලය මඟින් සපුරා ගැනීම හා අංක 07/2019 හා 2019.12.04 දිනැති අයවැය චක්‍රලේඛය පරිදි වියදම් සීමා කිරීම හේතුවෙන් සංවර්ධන සහායන් වැය විෂයෙහිද, මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී ඇති බව. | මුදල් රෙගුලාසි 50 හි ඇති විධිවිධාන ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට 1402 වැය විෂයය යටතේ වූ දුරකථන ගාස්තු වශයෙන් රු. 2,004,534 ක් ගෙවිය යුතුව තිබුණත්, එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) හි සඳහන් කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාලව NEW CIGAS වෙබ් අඩවියේ පල කරන ලද්දක් වන අතර, අදාල වටිනාකම 2019 වර්ෂයේ NEW CIGAS වෙබ් අඩවිය තුළ ගෙවිය යුතු බිල්පත් යටතේ ඇතුළත් කරන ලද්දක් වන බවත්, එම අගය 2020 වර්ෂයේදී අදාල වෙබ් අඩවියෙන් ගෙවීම් අගයක් ලෙස ඉවත් කරන ලද නමුත් එය වෙබ් අඩවිය තුළ නිවැරදිව යාවත්කාලීන නොවීම මත 2020 දෙසැම්බර් 31 දිනටත් පෙන්නුම් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන තුළින් සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් හෙළිදරව් කළයුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව<br><br>මුදල් රෙගුලාසි | අනුකූල නොවීම | | | |
| (අ) | මු.රෙ. 454(1) | (i) | භාණ්ඩ අයිතම 635 ක් භාණ්ඩ වට්ටෝරු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩ/ උපකරණ අදාල අංශවල වට්ටෝරු ලේඛනවලට ඇතුළත් කර ගන්නා ලෙස අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | (ii) | පෞද්ගලික ආරක්ෂක නිළධාරි කාර්යාලය (PSO) හා පරිශ්‍ර නිළධාරි කාර්යාල සඳහා භාණ්ඩ වට්ටෝරු ලේඛනය 2021 ජූලි 09 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වී නොතිබුණි. | පෞද්ගලික ආරක්ෂක නිලධාරී කාර්යාලයේ (PSO) තිබෙන වට්ටෝරු භාණ්ඩ, එම අංශයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස මේ වන විට අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී පෞද්ගලික ආරක්ෂක නිලධාරී කාර්යාලයේ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරනු ඇති බව. පරිශ්‍ර නිලධාරී කාර්යාලයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනය තුලනය කර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණු බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | (iii) අධ්‍යක්ෂ ජනරාල් (අභ්‍යන්තර පාලන අංශය) විසින් හා.ගා.ග.ප. 66 ලේඛනය 2021 ජූලි 09 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වී නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් (අභ්‍යන්තර පාලන) අංශයේ තිබෙන වට්ටෝරු භාණ්ඩ, එම අංශයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස මේ වන විට උපදෙස් ලබා දී ඇති බව.<br>ඒ අනුව 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී අධ්‍යක්ෂ ජනරාල් (අභ්‍යන්තර පාලන) අංශයේ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **මු.රෙ. 755** | භාණ්ඩ වට්ටෝරු ලේඛන ප්‍රකාරව භාණ්ඩ අයිතම 113 ක ඌනතාවයක් පැවතුණි. එම භාණ්ඩ වෙනත් පරිශ්‍රයන්ට නිකුත් කළ බව තහවුරු කිරීමට නිකුත් නියෝග ඉදිරිපත් නොවීය. | භාණ්ඩ/ උපකරණ, පරිශ්‍ර ඒකකය වෙත නිකුත් කර ඇති බැවින් "පොදු 141 නිකුත් කිරීමේ නියෝග" පරිශ්‍ර ඒකකය වෙත නිකුත් කරන ලෙස අදාල අංශ/ ඒකකවල ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇති බව.<br>අදාල භාණ්ඩ/ උපකරණ පරිශ්‍ර ඒකකයේ වට්ටෝරු ලේඛනවලට ඇතුලත් කර "පොදු 219 ලැබීම් නියෝග" අදාල අංශ/ ඒකක වෙත නිකුත් කරන ලෙස සහකාර අධ්‍යක්ෂ (පරිශ්‍ර ඒකකය) වෙත අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ඇ) | **මු.රෙ. 754** | ජනාධිපති ලේකම්ගේ කාර්යාලයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනය තුලනය කර 2021 ජූලි 09 දින වනවිටත් එහි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. | ජනාධිපති ලේකම්තුමාගේ කාර්යාලයේ තිබෙන වට්ටෝරු භාණ්ඩ, එම අංශයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස මේ වන විට අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් එම අංශයට උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී ජනාධිපති ලේකම්තුමාගේ කාර්යාලයේ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | **මු.රෙ. 760** | (i) | අනුරාධපුර ජනාධිපති මන්දිරයේ වර්ෂ කිහිපයක් පුරාම සමීක්ෂණ මණ්ඩල වලින් ඌනතාවයක් වශයෙන් ඉදිරිපත් කර ඇති 40' SONY LCD TV 02 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් උපදෙස් ලබාදී නොතිබුණි. | මෙම රූපවාහිනී යන්ත්‍ර දෙක (02) අළුත්වැඩියාව සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය වෙත ගෙන ගොස් ඇති බවත්, එම රූපවාහිනී යන්ත්‍ර දෙක (02) සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙත අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | (ii) | කතරගම ජනාධිපති මන්දිරයේ භෞතික පරීක්ෂාවේදී අයිතම 12 ක ඌනතාවයක් තිබුණි. ඉන් භාණ්ඩ 02 ක් අලුත්වැඩියා සඳහා 2013 හා 2017 වර්ෂයන්හි භාරදී තිබූ අතර, එම භාණ්ඩ අලුත්වැඩියාවන් නිම කර 2021 වර්ෂය වන විටත් ආපසු කාර්යාලයට ලැබී නොතිබුණි. | මෙම රූපවාහිනී යන්ත්‍රය සහ ෆැක්ස් යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය වෙත ගෙන ගොස් ඇති බවත්, එම රූපවාහිනී යන්ත්‍රය සහ ෆැක්ස් යන්ත්‍රය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙත අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | **මු.රෙ. 772** | | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශයේ 2019 වර්ෂයේදී අපහරණය කිරීමට භාරදී තිබූ පරිගණක UPS 02 ක් සඳහා කිසිදු නියෝගයක් 2021 ජූලි 09 දිනට විෂය නිලධාරියා වෙත ලබාදී නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශයේ අපහරණය කිරීමට භාරදී තිබූ පරිගණක UPS 02ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ ගබඩා කර ඇති බවත්, එම උපාංග වෙන්දේසි කිරීමට සැලසුම් කර ඇති බැවින් එම වෙන්දේසියෙන් පසු අදාල අයිතමයන්, වට්ටෝරු ලේඛනවලින් කපා හැරීමට අදාල නියෝග නිකුත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 26 දින සිට 2021 ජූලි 30 දින දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු එකතුව රු. 5,059,094 ක් වටිනා චෙක්පත් 122 ක් 2021 සැප්තැම්බර් 30 දින වනවිටත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඉන් මාස 06 ඉක්මවූ එකතුව රු. 453,736 ක් වටිනා චෙක්පත් 35 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021.08.31 දිනට මාස 06ක් ඉක්මවූ චෙක්පත් සඳහා මේ වන විට මු.රෙ.369 ප්‍රකාරව කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 තැන්පතු ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 6000-000-00-0006-0077 දරන තැන්පත් ගිණුම යටතේ 2015 වර්ෂයේ සිට පැවත එන රු. 292,333,243 ක තැන්පතු ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විටත් අක්‍රියව පැවතුණි. වර්ෂ 02 ට වැඩි කාලයක සිට පැවත එන තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අංක 6000-000-00-0006-0077 දරන ආපදා සහන අරමුදලෙහි 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.292,333,243 ක ශේෂය 2021 වර්ෂයේදී රජයේ ආදායමට බැරකර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී අංශයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනගතවූ නමුත් කිසිදු නිලධාරියකු විසින් භාවිතා නොකරන ලද ජංගම දුරකථනයක් (01) අංශය තුළ පැවතුණි. | ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී අංශයේ වට්ටෝරු ලේඛනගත වී ඇති ජංගම දුරකථනය, හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී විසින් ලබාගෙන ඇතත්, භාවිතයට නොගන්නා බැවින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය වෙත භාරදී ඇති බවත්, ඊට අදාල නිකුත් කිරීම් නියෝග හා ලැබීම් නියෝග අනුව මේ වන විට වට්ටෝරු පොත් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | උපයෝජනය නොකෙරෙන වත්කම් ඵලදායී ලෙස භාවිතා කළයුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු 09 ක් ඉටුකර ගැනීමේ ප්‍රගතිය, ප්‍රතිශතයක් ලෙසින් දක්වා තිබීම තුළින් එම ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව මැන බැලිය හැකි තත්ත්වයක් නොතිබුණි. | 2020.08.28 දිනැති රා.මු.ච.01/2020 සහ 02/2020 ට අදාලව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කළ යුතු ආකෘති පත්‍ර සහ ඒ සමඟ ඉදිරිපත් කළ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 12හි දීඇති උපදෙස් ප්‍රකාරව අදාල ආකෘතියේ ප්‍රගතිය ප්‍රතිශත ආකාරයෙන් දක්වා ඇති බව. | ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි කාර්යසාධන දර්ශක ඇතුළත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සැමට පානීය ජලය ලබාදීම සම්බන්ධයෙන් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සහ එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචිත වර්ෂය සඳහාවූ කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි. | අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ සහ ආයතන වෙත පවරා ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල පාර්ශවයන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සහ අවශ්‍ය රැස්වීම් සංවිධානය කිරීම ජනාධිපති කාර්යාලයේ අදාල එක් එක් අංශ විසින් සිදු කරනු ලබයි. එමෙන්ම, එම සියලුම සංවර්ධන කාර්යයන්ට අදාල කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ අවස්ථානුකූලව ඒවායේ ප්‍රගතිය අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම ද එම අංශ මගින් සිදු කරන බව.<br>ඒ අනුව, ව්‍යාපෘති සංඛ්‍යාව හෝ වැඩසටහන් පිළිබඳ තොරතුරු අදාල අමාත්‍යාංශ හෝ ආයතනයන්හි කාර්යසාධනය යටතට ගැනෙන බව. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි කාර්යසාධන දර්ශක, කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළයුතු වීම. |
| (ඇ) | "දැයට එළිය" ව්‍යාපෘතිය යටතේ ලක්ෂයකට අධික ඉතාම දිළිඳු පවුල් සඳහා කිසිදු අයකිරීමකින් තොරව විදුලිය ලබාදීම යන ඉලක්කය සඳහා ජයග්‍රහණ දර්ශකය ලෙස පවත්වනු ලබන රැස්වීම්/ සාකච්ඡා සංඛ්‍යාව ලෙස සඳහන් කර තිබුණි. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග හෝ ඉටුකළ ව්‍යාපෘති පිළිබඳ සංඛ්‍යාත්මකව මැනිය හැකි දර්ශක කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි. | -එම - | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි කාර්යසාධන දර්ශක, කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පරිපූර්ණ සහ සාධාරණ අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සහ සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ෆයිබර් ඔප්ටික්ස් තාක්ෂණික සම්බන්ධතා ලබාදුන් පාසල් සංඛ්‍යාව කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි. | -එම - | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි කාර්යසාධන දර්ශක, කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළයුතු වීම. |